ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව
උපාධි වැඩසටහන- 6 වන මට්ටම
අවසාන පරීක්ෂණය - 2023/2024
**EPU6231 - ප්‍රාථමික පාසල් සැකසුම් තුළ මාර්ගෝපදේශනය සහ උපදේශනය**
කාලය - පැය දෙකයි. (02)

---

දිනය - 2025.06.28 වේලාව - ප.ව.01.30 - ප.ව.03.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට ද (03) පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. සුදුසු නිර්වචන සමඟ "මාර්ගෝපදේශනය සහ උපදේශනය" යන පද නිර්වචනය කරන්න.

02. මාර්ගෝපදේශනය සහ උපදේශනය අතර වැදගත් වෙනස්කම් දෙකක් (02) කෙටියෙන් පැහැදිලි කරන්න.

03. "ආතති සහගත සිදුවීම් ළමුන් තුළ සමායෝගී ගැටළු ඇති වීමට මග පාදයි." ඉහත ප්‍රකාශය මත පදනම්ව,දරුවන්ගේ හැසිරීම් වලට බලපෑම් කරන සාධක සාකච්ඡා කරන්න.

04. "ගැටළුකාරී හැසිරීම්" යන යෙදුම උදාහරණ සමඟ විස්තර කරන්න.

05. සුදුසු උදාහරණ සහිතව පාසල් ප්‍රතික්ෂේප කිරීමේ රෝග ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කරන්න.

06. ළමා හැසිරීම් පිරික්සුම් ලැයිස්තුව (CBCL) එහි කාර්යයන් ඇතුළුව විස්තර කරන්න.

07. ළමුන්ගේ මනෝවිද්‍යාත්මක සංවර්ධනයේ මනෝලිංගික අවධි පහ (05) කෙටියෙන් පැහැදිලි කරන්න.

08. මාර්ගෝපදේශනයේ සහ උපදේශනයේ වැදගත් අංග පහක් (05) ලැයිස්තුගත කරන්න, ඒවායින් ඕනෑම දෙකක් (02) කෙටියෙන් පැහැදිලි කරන්න.

ලකුණු 05 X 08 =40

## 2 කොටස

09. I. අධ්‍යාපනික පරිසරයක් තුළ මාර්ගෝපදේශනයේ සහ උපදේශනයේ අරමුණු අවම වශයෙන් පහක් (05) උදාහරණ සමඟ සාකච්ඡා කරන්න. (ලකුණු 10 )

    II. මාර්ගෝපදේශනයේ සහ උපදේශනයේ ප්‍රධාන කාර්යයන් උදාහරණ සමඟ පැහැදිලි කරන්න. (ලකුණු 10 )

10. I. ප්‍රාථමික පාසල් ළමයින් තුළ දක්නට ලැබෙන පොදු සමායෝගී ගැටළු අවම වශයෙන් හතරක් (04) උදාහරණ සමඟ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10 )

    II. සමායෝගී ගැටළු ඇති ළමුන්ට, පාරිසරික සාධක වල බලපෑම උදාහරණ සහිතව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10 )

11. I. ළමයින්ගේ සෑම අවධියකම සංවර්ධනය සඳහා චිත්තවේග, ප්‍රජානන, සමාජීය සහ විද්‍යාත්මක සාධකවල තීරණාත්මක කාර්යභාරය සාකච්ඡා කරන්න. (ලකුණු 08 )

II. ප්‍රාථමික ළමයින් අතර දක්නට ලැබෙන සමයෝගී ගැටළු ඇති වීම සඳහා දායක වී ඇති පොදු හේතු පැහැදිලි කරන්න. (ලකුණු 12 )

12. I. ළමයින් තුළ ගැටලුකාරී හැසිරීම් අවම කිරීමට සහාය වීම සඳහා, රැකබලා ගන්නන්ට "ධනාත්මක මඟ පෙන්වීමේ" වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 06 )

II. සමයෝගී ගැටළු වලට මුහුණ දෙන ළමුන් සඳහා ප්‍රතිකාර ක්‍රියාවලියේදී ළමා මනෝ වෛද්‍යවරයෙකුගේ සහ චිකිත්සකයෙකුගේ දායකත්වය විස්තර කරන්න. (ලකුණු 06 )

III. පාසල් පද්ධතියේ සිසුන්ගේ ගැටළුකාරී හැසිරීම් කළමනාකරණයේ පවතින ප්‍රභලතා සහ දුබලතා උදාහරණ සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08 )

13. පහත සඳහන් ඕනෑම කරුණු දෙකක් **(02)** සඳහා කෙටි සටහන් ලියන්න.

I. මාර්ගෝපදේශනය සහ උපදේශනයේදී ආචාරධර්ම පද්ධතියක වැදගත්කම.

II. ශ්‍රී ලාංකාවේ උපදේශන සේවා ඉතිහාසය.

III. පාසල්වල ඵලදායී උපදේශකයින්ගේ ලක්ෂණ.

IV. මාර්ගෝපදේශනය සහ උපදේශනයේ විවිධත්වය. (10 X 02= ලකුණු 20)

*-සියලුම හිමිකම් ඇවිරිණි.-*